## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2015

---

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 01 දරණ මෝටර් වාහන වායු විමෝචන පාලනය කිරීම් නියෝග යටතේ, 2009 දෙසැම්බර් 29 දින එළඹ ඇති වායු විමෝචන පරීක්ෂණ භාර ඔප්පුවේ 9 (ඇ) ඡේදය සහ 2009 අංක 8 දරණ මෝටර් වාහන පනත මගින් සංශෝධිත මෝටර් වාහන පනතේ (203 අධිකාරය) 29 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 01**

------------------------------------------------

ගිණුම් ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇතිවිටක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු නමුත් රු.760,510 ක බැංකු අයිරාව ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂයට හිලව් කර දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07**

------------------------------------------------

i. වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත්කල අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ කළයුතු නමුත් වත්කම් මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අරමුදල විසින් අනුගමනය කර තිබුණි.

ii. ගිණුම් කාලපරිච්ඡේදය අවසානයේ දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය හෙළිදරව් කළයුතු නමුත් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමෙන් සිදුවන ලාභ හෝ අලාභ ඒවා මිලදීගත් වර්ෂය තුළදී ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. 2012 සිට 2014 දක්වා වර්ෂවල සිදුවූ අලාභ රු. 6,143,912 ක් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලින් අඩුකර තිබූ අතර, 2013 වර්ෂයේ මිලදීගත් 2016 වර්ෂයේ කල්පිරීමට නියමිත බැඳුම්කරයකට අදාල ලාභය රු. 1,836,621 ක් අදාළ වර්ෂයේ ලාභ ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය වූ රු.281,702 ක මුදල් සේවක අර්ථසාධක වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 3.2 (ආ) ඡේදය | ගෙවීමට ඇති වගකීම් නිරවුල් කිරීමෙන් පසු අතිරික්ත මුදල් හා කල්පිරුණු ආයෝජන අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරුකිරීම සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ උපලබ්ධි වූ රු. 381,854,568 ක භාණ්ඩාගාර බිල්පත්ද යොදාගෙන රු. 514,999,271 ක නව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගෙන තිබුණි. එසේම තවදුරටත් රු. 80,853,558 ක මුදලක් තැන්පතු වශයෙන් බැංකු ගිණුම් වල පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වසර තුල කිසිදු මුදලක් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. |
| (ii) 4.2 (ඇ) ඡේදය | එක් එක් කාර්තුව සඳහා වූ අරමුදලේ ප්‍රගතිය පිළිබඳ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.176,143,565 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.126,399,391 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 49,744,174 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදී අන්තර්ජාතික සම්මන්ත්‍රණ වෙනුවෙන් හා මාධ්‍ය මගින් දැනුවත් කිරීම් වෙනුවෙන් රු. 46,982,507 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එවැනි වියදම් දරා නොතිබීම මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් වෙනුවෙන් වූ ක්ෂය සඳහා ගැලපීම් කිරීමෙන් පසුව අරමුදලේ දායකත්වය 2011 වර්ෂයේ සිට අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ එය රු. 204,524,702 ක් විය. වාර්ෂිකව ලියාපදිංචි කෙරෙන වාහන සංඛ්‍යාවේ වැඩිවීම හේතුවෙන් මෙවැනි වර්ධනයක් සිදුවී තිබෙන බව නිරීක්ෂණය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

අරමුදලේ සමාලෝචිත වර්ෂයේ ක්ෂණික අනුපාතය 8547:1 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී 235:1 ක් විය. ඒ අනුව අරමුදලේ එදිනෙදා කටයුතුවලට අවශ්‍ය මුදලට වඩා වැඩි කාරක ප්‍රාග්ධනයක් පවත්වාගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
------------------

(අ) අරමුදලේ අරමුණු හා අභිමතාර්ථ ලෙස,

- මෙහෙයුම් කටයුතුවලට පහසුකම් සැපයීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙනයාම.

- කාර්යක්ෂම හා ඵලදායී අධීක්ෂණ හා ඇගයීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා පරීක්ෂණ උපකරණ ලබා ගැනීම.

- වැඩසටහන් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යය මණ්ඩල සේවා ලබා ගැනීම.

- පරීක්ෂණ අධීක්ෂණ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා සංවර්ධනය.

- වාහන කළමනාකරණය හා මාර්ග ආරක්ෂාව තුළින් අරමුදලේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සහ සෞඛ්‍ය අවදානම අඩු කිරීමෙන් මහජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීමට වායු තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් පැවැත්වීම හා අධීක්ෂණය දක්වා තිබුණි.

(ආ) වායු දූෂණය සිදු වී ඇති ක්ෂේත්‍ර හා ප්‍රදේශ හඳුනාගැනීමට අරමුදල විසින් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ නමුත් සෞඛ්‍ය අවදානම අඩුකිරීමෙන් මහජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීමට වායු තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ඇම්බියන්ට් එයාර් කොලිටි (Ambient Air Quality) ව්‍යාපෘතියට ලබාගන්නා සේවාව වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ රු.16,195,000 ක සේවා ගිවිසුමකට එළඹ තිබූ අතර එම මුදලින් රු. 8,000,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මේ සම්බන්ධව කරන මිලදීගැනීම් අරමුදලේ එකඟතාවය සහිතව විශ්වවිද්‍යාලය විසින් සිදුකළයුතු නමුත් වර්ෂය තුළ කරන ලද ප්‍රසම්පාදන පිළිබඳව අරමුදල වෙත වාර්තා කර නොතිබුණි. අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළයුතු ප්‍රගති වාර්තාද නියමිත කාලය තුළ ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දිවයිනේ පැවති මුළු වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව 384 ක් වූ අතර ඉන් 75 ක් හෙවත් සියයට 20 ක ප්‍රමාණයක් වායු විමෝචන භාරකාර අරමුදල මගින් පරීක්ෂා කර ඇති බවට වාර්තා වී තිබුණි. පරීක්ෂාවට ලක්කර තිබුණු මධ්‍යස්ථාන 15 ක් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අත්හිටුවා තිබුණු අතර එය පරීක්ෂාවට ලක්කළ මධ්‍යස්ථානවලින් සියයට 20 ක ප්‍රතිශතයකි. ඒ අනුව පරීක්ෂාවට ලක්නොකළ මධ්‍යස්ථානවලින් නිකුත් කරන දුම් සහතිකවල විශ්වාසනීයත්වය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වායු විමෝචන පරීක්ෂණ සිදු කරන පුද්ගලික ආයතන 02 විසින් වාහන 3,731,629 ක් සඳහා දුම් සහතික නිකුත් කර තිබුණු අතර ඉන් වායු විමෝචන භාරකාර අරමුදල මගින් සමාලෝචිත වර්ෂයේදී වායු විමෝචන පරීක්ෂණ 5,391 ක් පමණක් සිදු කර තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 0.14 කි. ඒ අනුව වායු විමෝචන පරීක්ෂණ කටයුතුවල නිවැරදිතාවය පිළිබඳව වායු විමෝචන භාරකාර අරමුදල මගින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) මාර්ගස්ථ දුම් පරීක්ෂාවට ලක්කර තිබූ වාහන 3,160 කින් 713 ක්ම අදාල ප්‍රමිත තත්ත්වයන්ගෙන් තොර බව හඳුනාගෙන තිබුණි. එම වාහන 713 න් 62 ක් නැවත දුම් පරීක්ෂාවන් සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර අදාල වාහන වල සමාලෝචිත වර්ෂයේ ආදායම් බලපත්‍රය පමණක් වායු විමෝචන භාරකාර අරමුදල මගින් රඳවා ගෙන වාහන නිදහස් කර ගෙන තිබුණි. එලෙස රඳවාගත් බලපත්‍ර පිළිබඳව බලපත්‍ර නිකුත් කරන නිලධාරීන් දැනුවත් කිරීමක් සිදුකර නොතිබීමෙන් අදාල වාහන හිමිකරුවන්ට අවිධිමත් ලෙස නැවත ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) දුම් සහතික නිකුත් කරන ආයතනවල කටයුතු පිළිබඳව සොයා බැලීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් යොදා නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අරමුදලේ වැය විෂයයන් 5 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 82 සිට සියයට 100 දක්වා වූ විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

අරමුදල සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනය මගින් රු.211,780,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2006 මාර්තු 26 දිනැති අංක 28 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ඒ සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලට රු. 226,740,603 ක ආදායමක් ලැබී තිබුණු අතර රු.50,597,038 ක වියදමක් දරා තිබුණි. එහෙත් මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධානයන් ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර භාණ්ඩාගාරයේ කළමණාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් 2009 ජුනි 09 දින නිකුත් කළ චක්‍රලේඛ අංක DMA/2009(1) හි උපදෙස් පිළිපැද නොතිබුණි.

## 6. පද්ධති හා පාලන දුර්වලතා

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලද අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට හා ගිණුම්කරණ මූලධර්ම වලට අනුගත වීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය.